මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

# අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

# මානව සම්පත් තොරතුරු පද්ධතියක් (HRIS) ක්‍රියාත්මක කිරීම සඳහා මිල ගණන් කැඳවීම

## IFB අංකය: NDDCB/PROCD/CAP/SD/01/2025

ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් මානව සම්පත් තොරතුරු පද්ධතියක් (HRIS) ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍යතාපූර්ණ මෘදුකාංග සංවර්ධකයන්ගෙන් මුද්‍රා තබන ලද යෝජනා කැඳවා සිටී.

1. ලංසු කැඳවීම මෙම ජාතික තරඟකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.
2. සාර්ථක ලංසුකරුවා අසාධු ලේඛනගත වී නොසිටිය යුතු අතර අදාළ ක්ෂේත්‍රයේ වසර 5ක අත්දැකීම් සහ ව්‍යාපාර ලියාපදිංචියක් සහිත විය යුතුය.
3. මීට අමතරව ලංසුකරුවා 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත සහ ඊට අනුෂාංගික ගැසට් නිවේදනවලට (PCA3) අනුකූලව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද කොන්ත්‍රාත් ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.
4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය යන ලිපිනයේ 1 වන මහලේ ඇති මූල්‍ය අංශයෙන් ලංසු ලේඛනය ලබා ගත හැකිය. (දුරකථන අංකය. 0112868794-6)
5. 383, කෝට්ටේ පාර, රාජගිරිය පිහිටි අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩල කාර්යාලයේදී **2025 ජූනි 06** වන දින පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත.
6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, **2025 මැයි 28** දින සිට සතියේ වැඩකරන දිනවල **පෙ.ව.9.00 සිට ප.ව.3.00** තෙක් **රු. 2,000.00** ක නැවත ගෙවනු නොලබන ගාස්තුවක් ගෙවා සභාපති, ප්‍රසම්පාදන කමිටුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර මූල්‍ය අංශය වෙතින් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගත හැකිය.
7. පිටපත් දෙකකින් යුතුව මුද්‍රා තබනු ලබන ලංසු **2025 ජූනි 16** දින **ප.ව. 2.15** ට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දිය හැකිය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ HRI පද්ධතිය යනුවෙන් ලිවිය යුතුය.
8. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු භාර ගැනීම අවසන් වූ වහාම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය ස්ථානයේ 3 වන මහලේ පිහිටි ශ්‍රවණාගාරයේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
9. ලංසු භාර ගැනීමේ අවසන් දිනයේ සිට **දින 90** දක්වා ලංසු වලංගු විය යුතුය.
10. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වනු ඇත. එමෙන්ම, කිසිදු හේතුවක් නොදන්වා ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හට අයිතිය ඇති අතර ලංසු පිළියෙළ කිරීම හෝ භාරදීම සඳහා ලංසුකරුවාගෙන් වියදම් වූ කිසිදු මුදලක් සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය වග නොකියනු ඇත.

**සභාපති,**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**
**383, කෝට්ටේ පාර**
**රාජගිරිය.**

SELACINE